සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

# ශිල්ප කලා - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

01. මිනිසාගේ සිතුම් පැතුම් අවශ්‍යතා මුල්කර ගනිමින් ජනකලා බිහි වී ඇත. ඒවා දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය කලා ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා ලෙස වර්ග වේ. දෘෂ්‍ය කලාවෙක් නොවන්නේ මින් කුමක් ද?
(1) පේෂ කර්මාන්තය (2) ලී කැටයම් (3) පැල් කවි (4) ලාක්ෂා කර්මාන්තය

02. ජනකලා අතර ඇති සොකරි නාට්‍ය අයත් වන්නේ,
(1) ශ්‍රව්‍ය කලාවන්ට ය. (2) දෘෂ්‍ය කලාවන්ට ය.
(3) ඉහත කිසිවකට නොවේ. (4) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවන්ට ය.

03. ලාක්ෂා කර්මාන්ත සාම්ප්‍රදායිකව පවත්වාගෙන යනු ලබන ප්‍රදේශ මොනවා ද?
(1) පල්ලෙහපුවිද, හුරීකඩුව, අගුල් මඩුව (2) මාතර, ගාල්ල, හුරීකඩුව
(3) අනුරාධපුර, ගාල්ල, මහනුවර (4) මහනුවර, මාතර, පල්ලෙහපුවිද

04. වෙස්මුහුණු කලාව සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශ මොනවා ද?
(1) මාතර, ගාල්ල, තංගල්ල, හික්කඩුව (2) අම්බලන්ගොඩ, හික්කඩුව, ගාල්ල, දෙවුන්දර
(3) මිරිස්ස, දෙවුන්දර, උඩුපිල, අම්බලන්ගොඩ (4) මාතලේ, මාතර, ගාල්ල මහනුවර

05. ඉඳි කොළ, තල් කොළ, පොල් කොළ ආදී ශාක පත්‍ර භාවිත කරන ජනකලා කර්මාන්තය හැඳින්වෙන්නේ,
(1) බීරළු කර්මාන්තය (2) පිත්තල කර්මාන්තය
(3) වෙස්මුහුණු කර්මාන්තය (4) පන් පැදුරු කර්මාන්තය

06. අඳුරු කිරීමේ රේඛා, දීර්ඝ කිරීමේ රේඛා, මිනුම් රේඛා සඳහා භාවිත කරන රේඛා වර්ග හඳුවන්නේ,
(1) සිහින් දාම රේඛා (2) ඝන අඛණ්ඩ රේඛා
(3) දෙකෙළවර ඝන දාම රේඛා (4) සිහින් අඛණ්ඩ රේඛා

07. දාදුකැටය අයත් වන්නේ කුමන ජ්‍යාමිතික වස්තුවකට ද?
(1) ඝන ජ්‍යාමිතික වස්තුවක් ලෙස.
(2) තල ජ්‍යාමිතික වස්තුවක් ලෙස.
(3) ද්විමාන ජ්‍යාමිතික වස්තුවක් ලෙස.
(4) චතුස්තල අයත් ජ්‍යාමිතික වස්තුව හැඩතලයකට.

08. රූපයේ දැක්වෙන විහිත චතුරස්‍රයේ ඇතුළත් කෝණවල අගයයන් ඇතුළත් පිළිතුර තෝරන්න.



(1) $90^0, 30^0, 60^0$
(2) $90^0, 45^0, 30^0$
(3) $45^0, 30^0, 60^0$
(4) $60^0, 45^0, 90^0$

09. පහත දැක්වෙන කෝණ නිවැරදිව නම්කර ඇති පිළිතුර තෝරන්න.



(1) සුළු කෝණ, සෘජුකෝණ, මහාකෝණ

(2) මහා කෝණ, සුළු කෝණ, සෘජුකෝණ

(3) සෘජුකෝණ, මහා කෝණ, සුළු කෝණ

(4) මහා කෝණ, සෘජු කෝණ, සුළු කෝණ

10. රූපසටහනේ දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණ සිදු කිරීමට භාවිත කරන ජ්‍යාමිතික උපකරණය වන්නේ,



(1) කෝණමානය.

(2) විහිතචතුරස්‍රය

(3) කවකටුව

(4) අඩිකෝදුව

11. පහත රූප අතරින් විෂමපාද ත්‍රිකෝණය තෝරන්න.

(1) 

(2) 

(3) 

(4) 

12. කෝණ නිර්මාණයේ දී කෝණමානය හැර භාවිත කළ හැකි වෙනත් උපකරණ කාණ්ඩය තෝරන්න.

(1) කෝණමානය, බෙදුම්කටුව

(2) කවකටුව, විහිත චතුරස්‍ර යුගල

(3) විහිතචතුරස්‍ර යුගල, කෝණමානය

(4) කෝදුව, බෙදුම් කවකටුව

13. වෘත්තයක් නිර්මාණයේ දී දැකිය හැකි රේඛා වර්ග මොනවා ද?

(1) සරල රේඛා (2) ආනත රේඛා (3) අක්වක් රේඛා (4) වක්‍ර රේඛා

14. අරය 3 cm වූ වෘත්තයක් ඇඳ, එම අරය පරිධියේ ලකුණු කිරීමෙන් පසු එම ලක්ෂ යා කළ විට ලැබෙන බහු අස්‍රය වන්නේ,

(1) පංචාස්‍රය (2) සප්තාස්‍රය (3) ෂඩාස්‍රය (4) දසාස්‍රය

15. රූපයේ දැක්වෙන නිර්මාණය සඳහා යොදාගෙන ඇත්තේ වෘත්තයේ කුමන කොටස් ද?



(1) වෘත්ත ඛණ්ඩය, පරිධිය.

(2) අර්ධ වෘත්තය, වෘත්ත ඛණ්ඩය

(3) අර්ධ වෘත්තය, සරල රේඛා

(4) කේන්ද්‍රික ඛණ්ඩය, වෘත්ත පාදය

16. හණ කෙඳි වලින් වියනු ලබන රෙදි හඳුවන්නේ කුමන නමකින් ද?

(1) ලිනන් (2) කපු (3) විස්කෝස් (4) ගෝණි

17. ඉතාම සිනිඳු සේද කෙඳි ලබාගත හැක්කේ,

(1) ඒරී පටපණුවා ගෙනි.

(2) ඕක් පටපණුවා ගෙනි.

(3) මල්බෙරි පටපණුවා ගෙනි.

(4) පටපණුවා ගෙනි.

18. ඛණිජ කෙඳිවලට අයත් වන්නේ,

(1) පෛනා, රැමී, සීසල් මගින් ලබා ගන්නා කෙඳිය.

(2) වීදුරු, රැමී, ප්ලාස්ටික් මගින් ලබාගන්නා කෙඳිය.

(3) සෙලියුලෝස්, කියුප්‍රැමෝනියම්, ඇක්‍රිලින් මගින් ලබාගන්නා කෙඳිය.

(4) වීදුරු, ඇස්බැස්ටෝස්, රන් මගින් ලබාගන්නා කෙඳිය.

19. වහා ගිනි ගැනීම, කහපාට ලොකු ගිනිදලු ඇතිවීම, කඩදාසි පිළිස්සෙන ගඳ වහනය වීම වැනි ලක්ෂණ පිළිස්සීමේ දී පෙන්නුම් කරන රෙදි වර්ගය වන්නේ,

(1) ලිනන් (2) කපු (3) ලෝම (4) සේද

20. ලොව ඇති කපු වර්ග අතරින් ඉතා උසස් කපු වර්ගය ලෙස සැලකෙන්නේ,

(1) ඇමරිකන් උස්බිම් කපු (2) සී අයිලන්ඩ් කපු

(3) දකුණු ඇමරිකන් කපු (4) ඉන්දියන් කපු

21. පහත රූප අතරින් දික්දාර වියමන දැක්වෙන රූපය කුමක් ද?



(1) (2) (3) (4)

22. රෙදි පිරියම්කරණයට ලක් කිරීමේදී රෙදිවල ඇති අපද්‍රව්‍ය රසායනික ද්‍රව්‍ය මගින් පිළිස්සීමට ලක්කර කාබන් බවට පත්කිරීම හඳුවන්නේ,

(1) මලහරණය (2) කබනීකරණය (3) විරංජනය (4) කැඳහරණය

23. ගිනි නොගැනීම, අම්ලයන් හි දිය නොවීම වැනි ගුණාංග නිසා කාර්මික කටයුතු සඳහා යොදාගන්නා කෙඳි විශේෂයකි.

(1) පොප්ලින් (2) රෙයොන් (3) ඇස්බැස්ටෝස් (4) පොලියෙස්ටර්

24. නිල් හා රතු වර්ණ මිශ්‍ර කිරීමෙන් සාදාගත හැකි ද්විතීක වර්ණ කුමක් ද?

(1) තැඹිලි (2) දම් (3) කොළ (4) කළු

25. නිල් වර්ණය ලා නිල් පැහැ වර්ණයක් ලෙස සකස් කිරීමට එකතු කළ යුත්තේ

(1) සුදු වර්ණය (2) කළු වර්ණය (3) කහ වර්ණය (4) නිල් වර්ණය

26. රෙදිපිළි අලංකරණයට විවිධ ක්‍රම යොදා ගනී. රෙදි මුද්‍රණය ලෙස හැඳින්වෙන්නේ,

(1) රෙද්ද මත පින්සල මගින් සායම් ගැල්වීම. (2) අච්චුවක් මගින් සායම් සහිත මුද්‍රා තැබීම.

(3) මුළු පෙහෙකම් ද්‍රව්‍ය පුරා වර්ණ පැතිරවීම. (4) සායම් භාජනක ගිල්වා රෙද්දේ සායම් පෙවීම.

27. ශාක කෙඳිවලට කැඳ දැමීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

(1) කෙඳිවල ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(2) නූල්වල දුඹුරු පැහැය ඉවත් කිරීම.

(3) ශාක කෙඳිවලට සායම් උරා ගැනීමට පහසු කිරීම.

(4) නූල්වල ශක්තිමත් බව වැඩි කිරීම.

28. ''ක්වාට්ස්'' ලෙස හැඳින්වෙන නොඇලෙනසුළු අමුද්‍රව්‍ය හැඳින්වෙන්නේ,

(1) තිරිවානා ගල් (2) හුණු ගල් (3) ග්‍රොග්‍ය (4) ඉල්මනයිට්

29. මහා පරිමාණ කර්මාන්ත ශාලාවල භාණ්ඩ සෑදීමට නොඇලෙනසුළු අමුද්‍රව්‍ය කුඩුකර ගැනීම සඳහා යොදා ගන්නා යන්ත්‍රය වන්නේ,

(1) රෝලර් ක්‍රෂර් යන්ත්‍රය. (2) බෝල්මිල් යන්ත්‍රය.

(3) ජෝක්‍රෂර් යන්ත්‍රය. (4) ෆිල්ටර් ප්‍රෙෂ් යන්ත්‍රය.

30. වැසි, සුළං, ගංගා, ඇළදොළ, ජල ප්‍රවාහ, භූ චලන වැනි ක්‍රම මගින් ජීර්ණය වූ ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට තැන්පත් වන මැටි හඳුනවන්නේ,

(1) ප්‍රාථමික මැටි (2) ද්විතීක මැටි (3) පිහිටි මැටි (4) ශේෂ මැටි

31. මාතෘ පාෂාණ දිරාපත් වී මැටි සෑදේ මැටි හඳුන්වන රසායනික නාමය වන්නේ,

(1) ඇලුමිනියම් ඩයොක්සයිඩ් (2) පෙල්ස්පාර්

(3) සිලිකන් ඩයොක්සයිඩ් (4) ඇලුමිනා සිලිකේට්

32. පැච්වර්ක් නිර්මාණ ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) ඇඳුම් තැනින් තැන කපා මැසීමයි.

(2) විවිධ වර්ණ රෙදි භාවිතයෙන් ඇඳුම් මැසීමයි.

(3) රෙදි කැබලි මසා හෝ අලවා කරන නිර්මාණය.

(4) රෙදි කැබලි කිරීමයි.

33. රිබන් එම්බ්‍රොයිඩර් සඳහා යොදා ගන්නා මැහුම් ක්‍රමයකි.

(1) බ්ලැන්කට් මැස්ම (2) පිස්මේන්තු මැස්ම (3) හුරුළුකටු මැස්ම (4) ලූප් මැස්ම

34. මැටි දරණු භාවිතයෙන් භාණ්ඩ තැනීමේ දී මැටි දරණු එකිනෙක අලවාගනු ලබන්නේ,

(1) මැටි පාප්ප මගිනි. (2) මැටි වාත්තු මගිනි. (3) වාත්තු දියර මගිනි. (4) අච්චු මගිනි.

35. මල්පීස්, පොප්ලින්, වොයිල් වැනි රෙදි වර්ග වියා ගැනීම සඳහා භාවිත කරන වියමන වන්නේ,

(1) ජටා වියමන (2) චාම් වියමන (3) දික්දාර වියමන (4) හරස්දාර වියමන

36. හැඩපෙති ආධාරයෙන් වියාගත හැකි විසිතුරු නිර්මාණයකි,

(1) තොප්පි (2) ඉනපටි (3) ගවුම් (4) මේස්

37. සේද කෙඳිවල ඇති සෙරසීන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ,

(1) මැලියම්කරණය (2) කාබනීකරණය (3) විරංජනය (4) මලහරණය

38. අතීතයේ වර්ණ ලබා ගැනීම සඳහා පාරිසරික සම්පත් යොදා ගැනුණි. කහ වර්ණය ලබා ගැනීම සඳහා භාවිත කරන ලද අමුද්‍රව්‍ය වන්නේ,

(1) මකුළු මැටි (2) නිල් අවරිය (3) ගොකටු ගසේ කිරි (4) අඳුන් දැලි

39. පහත රූප අතරින් ආයත චතුරස්‍රය තෝරන්න.

(1) 

(2) 

(3) 

(4) 

40. ඩේලියා මල සකස් කිරීම සඳහා පෙති සකස් කිරීමේදී අඳින ලද වෘත්තයන්ගේ අරයයන් වනුයේ,

(1) 3cm, 2cm, 1cm ය. (2) 5cm, 4cm, 3cm ය.

(3) 6cm, 4cm, 2cm ය. (4) 1c, 3cm, 5cm ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

# ශිල්ප කලා - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. ජන කලා හා කුඩා කර්මාන්ත නගා සිටුවීමේ අරමුණින් අත්කම් ප්‍රදර්ශනයක් හා ත්‍යාග ප්‍රධානයක් වයඹ පළාත තුළ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කර තිබේ. එය වයඹ පළාත් නගර ශාලාව තුළ පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී.

    (1) එම ප්‍රදර්ශනය සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමට ඔබටත් අවස්ථාවක් ලැබුණේ නම් ඒ සඳහා භාණ්ඩ තැනීමට භාවිත කළ හැකි දේශීය අමුද්‍රව්‍ය හතරක් නම් කරන්න.

    (2) එම අමුද්‍රව්‍ය භාවිතයෙන් නිපදවාගත හැකි අත්කම් භාණ්ඩ හතරක් නම් කරන්න.

    (3) උත්සවය සඳහා ප්‍රවිෂ්ඨ මාර්ගයේ තොරණක් සකස් කිරීමට අදහස් කරගෙන සිටී. ඒ සඳහා දළ සටහනක් නිර්මාණය කරන්න.

    (4) මෙම ප්‍රදර්ශනය සඳහා සුදුසු තේමා පාඨයක් නිර්මාණය කරන්න.

    (5) මෙම උත්සවයේ ආරාධිතයින්ට යවන ආරාධනා පත්‍රයක ඉදිරිපස අලංකාර කිරීමට සුදුසු නිර්මාණයක් ඉදිරිපත් කරන්න.

    (6) ශිල්ප කලා විෂය හදාරණ සිසුන්ට අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි රෙදි ආශ්‍රිත නිර්මාණ හතරක් නම් කරන්න.

    (7) ප්‍රදර්ශනයට තැබිය හැකි මැටි ආශ්‍රිත නිර්මාණ හතරක් නම් කරන්න.

    (8) ප්‍රදර්ශනයට ඉදිරිපත් කළ හැකි නිර්මාණ සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල හතරක් අඳින්න.

    (9) ආරාධිතයින් පිළිගැනීම සඳහා පිළිගැනීමේ ගීතය ගායනා කරන ගායිකාවන්ගේ සාරියේ ඉදිරිපස අලංකාර කිරීම සඳහා සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය යොදා ගැනීමට අදහස්කරගෙන සිටී. ඒ සඳහා සුදුසු සිදුරු තහඩුවකට ගැලපෙන මෝස්තරයක් අඳින්න. එහි කපා ඉවත් කරන කොටස් අඳුරු කර දක්වන්න.

    (10) නිර්මාණ ශිල්පීන් හඳුනා ගැනීම සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

02. විසිතුරු නිර්මාණ සඳහා ජ්‍යාමිතික හැඩතල බහුලව යොදා ගැනේ.

    (1) $60^0$ කෝණයට නිර්මාණය කර ABC ලෙස නම් කරන්න. (ලකුණු 02)

    (2) 6 cm ක් දිග AB රේඛාව සමාන කොටස් 5 කට බෙදන්න. (ලකුණු 04)

    (3) පාදයක දිග 4 cm ක් වූ සමචතුරස්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 04)

03. රෙදිපිළි අලංකරණයේ දී ඒ සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිත කෙරේ.

(1) රෙදිපිළි මුද්‍රණයේ දී යොදා ගන්නා පෙර පිරියම් ක්‍රම නම් කරන්න. (ලකුණු 02)

(2) වර්තමානය වන විට ස්වභාවික සායම් භාවිතය අඩුවෙමින් පවතී. ඊට බලපා ඇති හේතු 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(3) ඔබ කැමති පිළි අලංකරණ ක්‍රමයක් යොදා ගනිමින් කොට්ට උරයක් අලංකාර කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

04. විවිධ අලංකරණ ක්‍රම, විශේෂ සායම් වර්ග භාවිත කිරීම මගින් රෙදිපිළි අලංකාර කර ගැනේ,

(1) අතින් පින්තාරු කිරීමේ දී වඩාත් හොඳ පින්සලක් තෝරා ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න. (ලකුණු 02)

(2) අච්චු මුද්‍රණය සඳහා අච්චුවක් සැකසීමට සුදුසු මෝස්තරයක් අඳින්න. (නිර්මිත අච්චුවක් සඳහා) (ලකුණු 04)

(3) ස්වභාවික අච්චු භාවිතයෙන් ලේන්සුවක් අලංකාර කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

05. රෙදිපිළි නිෂ්පාදනය වර්තමාන වන විට සීඝ්‍ර දියුණුවක් දැකිය හැක.

(1) පෙහෙකම් කෙඳි වර්ග කළ හැකි ආකාරය ලියන්න. (ලකුණු 02)

(2) වර්තමානයේ කෘත්‍රිම රෙදි ජනප්‍රිය වීමට හේතු 04 ක් ලියන්න. (ලකුණු 04)

(3) චාම් වියමනේ ප්‍රභේද 02 ක මතුපිට පෙනුම අඳින්න. (ලකුණු 04)

06. මැටි නිර්මාණය වීම භෞතික රසායනික සහ ජීව විද්‍යාත්මක හේතුන්ගේ බලපෑම මත සිදුවේ.

(1) පාෂාණ ජීර්ණය වීමට බලපාන ස්වභාවික හේතු හතරක් නම් කරන්න. (ලකුණු 02)

(2) මැටිවල පවතින පහත සඳහන් රසායනික හා භෞතික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

a. සුවිකාර්යතාව  b. සවිවරතාව

c. හැකිළීම  d. වර්ණය (ලකුණු 04)

(3) මැටි භාවිත කර භාණ්ඩ තැනීමේ ක්‍රමයක් නම්කර එම භාණ්ඩය සකස් කරගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

07. ජ්‍යාමිතික හැඩතල යොදා ගැනීම තුළින් නිර්මාණවල අලංකාරය වැඩිකර ගැනීමට හැකි වේ.

(1) එක් කෝණයක් $60^0$ ක් වූ පාදයක දිග 5cm ක් වූ රොම්බසය නිර්මාණය කරන්න. (ලකුණු 02)

(2) බිත්ති සැරසිල්ලක් සඳහා අරය 5 cm ක් වූ වෘත්තයක් නිර්මාණය කර සමාන කොටස් 06 කට බෙදන්න. (ලකුණු 04)

(3) සබන් ඇසුරුමක ත්‍රිමාණ පෙනුමක් පහත දැක්වේ. කැමති පරිමාවක් ගෙන එහි විකසනය අඳින්න. (ලකුණු 04)



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 4 ) | 03. ( 1 ) | 04. ( 3 ) | 05. ( 4 ) | 06. ( 4 ) | 07. ( 1 ) | 08. ( 1 ) | 09. ( 2 ) | 10. ( 3 ) |
| 11. ( 2 ) | 12. ( 2 ) | 13. ( 4 ) | 14. ( 3 ) | 15. ( 2 ) | 16. ( 1 ) | 17. ( 3 ) | 18. ( 4 ) | 19. ( 2 ) | 20. ( 2 ) |
| 21. ( 1 ) | 22. ( 2 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 1 ) | 26. ( 2 ) | 27. ( 4 ) | 28. ( 1 ) | 29. ( 3 ) | 30. ( 2 ) |
| 31. ( 4 ) | 32. ( 3 ) | 33. ( 4 ) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 3 ) | 39. ( 4 ) | 40. ( 2 ) |

## II පත්‍රය

01. (1) පොල්කොළ, ඉඳි කොළ, පන් වර්ග (2) අත් පසුම්බි, තොප්පි, වට්ටි, පෙට්ටි, පැදුරු
(3) සුදුසු තේමා නිර්මාණයකට ලකුණ දෙන්න. (4) සුදුසු තේමා පාඨයකට ලකුණු දෙන්න.
(5) ඉදිරිපස සඳහා සුදුසු නිර්මාණයකට ලකුණු දෙන්න.
(6) කොට්ට උර, බිත්ති සැරසිලි, පාපිසි, ලේන්සු යනාදිය.
(7) මල් බඳුන්, සත්ව රූප යනාදිය
(8)  යනාදී හැඩතල
(9) අඳින ලද සුදුසු නිර්මාණයකට ලකුණු දෙන්න.
(10) සුදුසු ලාංඡනයකට ලකුණු දෙන්න. (ලකුණු 2 × 1 = 20)

02. (1) නිවැරදි නිර්මාණ කරන ලද ABC කෝණයට (ලකුණු 02)
(2) නිවැරදි AB රේඛාව සමාන කොටස් 05 කට බෙදීම (ලකුණු 04)
(3) නිවැරදි නිර්මාණය කරන ලද සමචතුරස්‍රයට ලකුණු දෙන්න. (ලකුණු 04)

03. (1) කැඳහරණය, මළහරණය, විරංජනය, කාබනීකරණය (ලකුණු 02)
(2) ⋆ සායම් නිෂ්පාදනය කාලයකට පමණක් සීමා වීම.
⋆ සායම් නිෂ්පාදන ප්‍රමාණවත් නොවීම.
⋆ සායම් කල්තබා ගැනීමේ ක්‍රමවේද නොතිබීම.
⋆ වර්ණ සකසා ගැනීමට වැඩිකාලයක් ගත වීම. (ලකුණු 04)
(3) අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ, සකස් කර ගැනීමේ පියවර නිවැරදි නම් ලකුණු දෙන්න. (ලකුණු 04)

04. (1) ⋆ ස්වභාවික කෙඳි මගින් නිෂ්පාදිත පින්සල් භාවිතයට ගැනීම.
⋆ වර්ණ කළ යුතු කොටසට ගැළපෙන අංකයන්ගෙන් යුත් පින්සල් තෝරා ගැනීම.
⋆ පින්සලේ කෙඳිවල ඝනකම අනුව පින්සල අංක කර තිබේ.
⋆ ජලයෙන් තෙමූ පසු පින්සලේ කෙඳි එකලස් වී තියබි යුතුය. (ලකුණු 02)
(2) අඳින ලද අච්චු මුද්‍රණයකට සුදුසු මෝස්තරයකට ලකුණු දෙන්න. (ලකුණු 04)
(3) අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ හා සකස් කරගන්නා ආකාරය පැහැදිලිව ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(ලකුණු 04)

05. (1) ස්වභාවික කෙඳි කෘත්‍රිම කෙඳි
(2) සේදීම පහසුයි, ඕනෑම වෙළඳපොලකින් ලබාගත හැක, වියළීම පහසුයි, සුලබයි, භාවිතය පහසුයි, සැහැල්ලු වීම.
යනාදී පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
(3) චාම් වියමනේ ප්‍රභේද දෙකක මතුපිට පෙනුම ඇඳීමට ලකුණු දෙන්න. (ලකුණු 04)

06. (1) සූර්ය තාපය, වර්ෂාව, විදුලි කෙටීම, ආර්ද්‍රතාව, හිමපතනය, ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය යනාදී කරුණු
(ලකුණු 02)
(2) a. සුවිකාර්යතාවය - මැටි ජලය සමඟ එක් වීමේ දී ඇතිවන ඇලෙනසුළු බව.
b. සච්ඡිද්‍රතාව - ජලය උරා ගැනීමේ හැකියාව / සිදුරු සහිත බව.
c. හැකිළීම - භාණ්ඩ තැනීමේ දී වියළීම හා පිළිස්සීම නිසා භාණ්ඩයේ පරිමාව අඩුවීමයි. ජලය හා වාතය මැටි අංශුවලින් ඉවත් වීම නිසා හැකිලේ.
d. වර්ණය - මැටිවල අඩංගු රසායනික ද්‍රව්‍ය අනුව නිෂ්පාදිත භාණ්ඩ පිළිස්සීමෙන් පසු ලැබෙන වර්ණ තීරණය වේ. (ලකුණු 04)
(3) මැටි තහඩු ක්‍රමය, මැටි දරණු ක්‍රමය, ඇඹීම යන ක්‍රම අතරින් එක් ක්‍රමයක් නම් කර සකස් කරගන්නා ආකාරය විස්තර කිරීමට ලකුණු දෙන්න. (ලකුණු 04)

07. (1) $60^0$ කෝණයක් සහිත රොම්බසය නිර්මාණයට ලකුණ දෙන්න. (ලකුණු 02)
(2) අරය 5cm වෘත්ත නිර්මාණය. එය කොටස් 06 කට බෙදීම නිවැරදිව කර ඇත්නම් ලකුණු දෙන්න.
(ලකුණු 04)
(3) 
නිවැරදිව විකසනය ඇඳ මිම් ලකුණු කිරීමට ලකුණු දෙන්න. (ලකුණු 04)